# මගේ ගෙදරට ආ යහළුවෝ



ISALI YESANSA RAJAMANTHRIEE

# මගේ ගෙදරට ආ යහළුවෝ

ISBN NO IS28835

ඉසලි යෙසන්සා

කතෘගේ වෙනත් කෘති

ගෙදරට ආ අමුත්තෝ

ISBN NO 978-624-206-002-6

කෘතිය පළ කල දිනය -2023/12/07

ප්‍රකාශකයෝ - ප්‍රින්ටින් හවුස් පිළිමතලාව

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.
එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.
2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ " දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලෙඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.
මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමඟින් පිරිනමමි.
මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.20

පිදුම

මගේ පොත හදන්න උදව් කල
මගේ අම්මාට, තාත්තාට මගේ
ලොකු අක්කාට,චූටි අක්කාට හා
මාගේ පන්තිභාර ගුරුතුමියට
ආදරයෙන් පුද කර සිටිමි.


ස්තුතිය!

මෙම කතන්දර පොත ලිවීමට මා
හට අවස්ථාව සලසා දුන් විදුහල්
පති තුමිය සහ
පන්තිභාර ගුරුතුමියට මාගේ
ස්තුතිය පුද කරමි.
අවැසි සියලුම දේ ලබාදුන් මගේ
අම්මාට සහ තාත්තාටද මාගේ
ආදරය පිරි ස්තුතිය පුද කරමි.

එක දවසක් අපේ ගෙදර එළියේ පුංචි කූඩුවක් හැදුවා.අම්මා,තාත්තා ලොකු අක්කා සහ චූටි අක්කා පොල් ලෙලි ගැහුවා.මම ඒ පොල් ලෙලි අරගෙන දිසානායක මාමාට දුන්නා.



එයා ඒ පොල් ලෙලි වලින් පොඩි කූඩු තුනක් හැදුවා.ඒවා අනිත් කූඩුව ඇතුලේ එල්ලුවා.හවස් වෙනකොට කූඩුව හදලා ඉවර වුණා.



දිසානායක මාමා තාත්තාගෙන් සල්ලි ඉල්ලාගෙන කඩයට ගියා.අපි එයා එනකල් බලාගෙන හිටියා.ටික වේලාවකින් එයා ආවා.හිල් විදපු පෙට්ටියක් අරගෙන ආවේ.



පෙට්ටිය කූඩුවට දාලා ඇරියාම එළියට ආවෙ ගිරවු තුන්දෙනෙක්.අපි හැමෝම නින්දට යන්න හැදුවාම ගිරවුන් භයියෙන් කෑගහන සද්දයක් ඇහුණා.එතකොට පූසෝ දෙන්නෙක් ඇවිත් ගිරවුන්ව අල්ලන්න හදනවා.



දිසානායක මාමා පූසෝ එලවන්න ගිහින් වැට කඩාගෙන වැටුණා.පූසෝ බයට ගියා.ඉතින් අපි ගිරවුන්ව විකුණුවා.එක දවසක් ආයෙත් අපේ ගෙදරට පූසෙක් ආවා.අපෙ අම්මා ඌට කෑම ටිකක් දුන්නා.ඉතින් ඒ පූසා අපේ ගෙදර ඉන්න පුරුදු වුනා. අපේ චූටි අක්කට බල්ලෙක් ඕන කියලා කිව්වා.



අම්මයි තාත්තයි දිසානායක මාමයි බල්ලෙක් ගේන්න ගියා.එයාලා පොඩි ලස්සන බල්ලෙක් ගෙනාවා.එයාගෙ වර්ගය “හස්කි”



අපි මුළු දවසම එයාට නමක් හෙව්වා.ලොකු අක්කා ෆෝන් එකෙන් බලලා නමක් හොයාගත්තා.ඒ නම තමයි "Brozy".දවසක් "Brozy" පැටව් දැම්මා.



එක පැටියෙක් පන්සලට
දුන්නා.අනිත් පැටියා මාමා
කෙනෙක්ට දුන්නා.එක්කෙනෙක්
අපි තියාගත්තා.




තියාගත්ත එක්කෙනාගෙ නම "Rover".අපේ "Rover"කළු පාටයි.දුඹුරු පාට ටිකකුත් තියෙනවා.එයා හරිම හුරතල්.ඒ වගේම දඟයි.එයා මස් කටු කන්න හරිම පෙරේතයි.



දැන් එයා හරිම උසයි,දිගයි,මගේ උරහිසට අත් දෙක තියනවා.



මට ඉතින් දැන පූසෙකුයි,බල්ලෝ දෙන්නකෙුයි ඉන්නවා.මම හැමදාම එයාලත් එක්ක සතුටින් සෙල්ලම් කරනවා.



නිමි.

පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20



ඉසලි යෙසන්සා රාජමන්ත්‍රී
මහ/මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර

ISBN NO IS28835